Nonviolent Peaceforce

## කාර්යාල වාහනයේ අත්බෝම්බයක් සොයා ගැනීම පිළිබඳව අවිහිංසාවාදී සාම බලකාය විමතියට පත් වේ.

තම ආයතන වාහනයේ පිටුපස පිව අත් බෝම්බයක් සොයා ගැනීම පිළිබඳව අවිහිංසාවාදී සාම බලකාය විමතියට පත්වන අතර දැඩි ලෙස අවධානයෙන් පසුවෙයි. සියළුම ආකාරයේ ප්‍රචණ්ඩ ක්‍රියා හෙලා දකින ආයතනයක කුමනාකාරකින් හෝ හමුදා අවි ආයුධ දැනුවත්ව / හිතාමතා තම ආයතනයේ වාහනයක රැගෙන යාම තම මූලික විශ්වාසයට හා ප්‍රතිපත්තින්ට පටහැනිය.

ආයතන වාහනය තුල තම සේවකයන් දැනුවත්ව පිව අත් බෝම්බයක් රැගෙන යනු ඇතැයි සැක කිරීමට කිසිදු හේතුවක් නොමැති අතර, උපකල්පනය කළ හැකි එකම කරුණ නම් මෙම බෝම්බය සේවක අනුදැනුමෙන් තොරව වාහනය තුළ තබා ඇති බවයි. මෙවැනි සිදුවීම් තවදුරටත් සිදුවිය හැකි බැවින් ඒ ගැන අවධානයෙන් සිටින ලෙස ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන හා එක්සත් ජාතින්ගේ සංවිධාන වලට අවිහිංසාවාදී සාම බලකාය අනතුරු අඟවයි.

අවස්ථානුකූලව මෙම අත් බෝම්බය සොයා ගැනීම හා එය ඉවත් කිරීමෙන් තම සේවකයන් හා අනෙකුත් අය අනවශ්‍ය තුවාල හා මරණින් වැළක්වීම සම්බන්ධයෙන් මෙම අවස්ථාවේදී අවිහිංසාවාදී සාම බලකාය ආරක්ෂක හමුදාවට කෘතඥ වෙයි.

අවිහිංසාවාදී සාම බලකාය මෙම කරුණ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පවත්වන අතර නිරතුරුවම තම වාහන වල අභ්‍යන්තර ආරක්ෂාව සම්බන්ධයෙන් දැඩි අවධානයෙන් කටයුතු කරයි.

මෙම කණගාටුදායක සිද්ධිය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාව විසින් පවත්වනු ලබන පරීක්ෂණ වලට අවිහිංසාවාදී සාම බලකාය පූර්ණ සහයෝගය දක්වයි.

A 26A Ediriweera Mawatha Dehiwala Sri Lanka
T (+94) 11 2736814 | F 273 6958
E nplanka@nonviolentpeaceforce.org